සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

| 43 | S | I |
| --- | --- | --- |

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

Second Term Test - Grade 13 - 2018

විභාග අංකය .............................

# ක්‍රිස්තු ධර්මය I

කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයකට 1,2,3,4,5 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ලකුණු කරන්න.**

01. ශුද්ධ ලියවිල්ල හෙබ්‍රෙව් අරමීය, ග්‍රීක හා ලතින් බසින් හඳුන්වන නාම නිවැරදිව පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

i. සෙප්ටුවාජින්ත, මැසොරෙටික්, වල්ගේට් පිටපත්ය.

ii. මැසොරෙටික්, සෙප්ටුවාජින්ත, වල්ගේට් පිටපත්ය.

iii. වල්ගේට්, මැසොරෙටික්, සෙප්ටුවාජින්ත පිටපත්ය.

iv. මැසොරෙටික්, වල්ගේට්, සෙප්ටුවාජින්ත, පිටපත්ය.

v. සෙප්ටුවාජින්ත, වල්ගේට්, මැසොරෙටික්, පිටපත්ය.

02. ශුද්ධ බයිබලය පෙරදිග පොතක් ලෙස සැලකීමට හේතු වන්නේ,

i. පුරාණ භාෂාව අදහස් හා දර්ශන ඇතුළත් වීම.

ii. දිවැසිවැනි වැකි සාහිත්‍ය රසාංග වලින් සමන්විතවීම.

iii. පෙරදිගට ආවේණික වූ චින්තනය හා භාෂාව ඇලත්වීම.

iv. ඓතිහාසික කථා, මිථ්‍යා කථා ඇතුළත් වීම.

v. ප්‍රේම කථා, කෙටි කථා, ප්‍රස්ථා පිරුළු ඇතුලත් වීම.

03. පලස්තීනයේ ප්‍රධාන භූගෝලීය කලාපයක් වන මුහුදු තීරයේ දකුණු භාගයේ ආක්‍රමණය කර පදිංචි වූ ජන කොටස වන්නේ,

i. පිලිස්තිවරු ii. එසීනිවරු iii. හිත්තිවරු

iv. හෙබ්‍රෙව්වරු v. අබිමෙලෙක්වරු

04. ඊශ්‍රායල් රාජ්‍ය තන්ත්‍රය ආරම්භ වූයේ,

i. ක්‍රි.පූ. 922 දීය. ii. ක්‍රි.පූ. 961 දීය. iii. ක්‍රි.පූ. 1015 දීය.

iv. ක්‍රි.පූ. 1020 දීය. v. ක්‍රි.පූ. 1021 දීය.

05. අපර විප්‍රවාසි යුගයේ බබ්ලෝනියාව යටත් කර ගත් රජ වන්නේ,

i. දාරියුස් රජය. ii. හොරෝද් රජය. iii. රෙහෙබොවාම් රජය.
iv. ජෙරොබොවාම් රජය. v. සයිරස් රජය.

06. රෝම අධිරාජ්‍යයේ ක්‍රි.පූ. 63 දී රෝම ජාතික පොම්පේ සෙන්පතියා කළ කාර්යයක් වන්නේ,

i. ව්‍යවස්ථාවලිය යලිත් රටේ ප්‍රකාශ කිරීම.

ii. පුදෙව්වරුන්ට නැවත සිය රටට ආපසු යෑමට සැලැස්වීම.

iii. ජෙරුසලම වටලා පලස්තීනය අල්ලාගෙන රෝම අධිරාජ්‍යයේ යටත් විජිතයක් කිරීම.

iv. දේව මාලිගාව නැවත ගොඩනැගීම.

v. ජෙරුසලම් පවුර ඉදිකිරීම.

07. පුජක සම්ප්‍රදායේ සඳහන් වන අදහසක් වන්නේ,

i. සොබාදහම හා මිනිස් ඉතිහාසය තුළ දෙවියන් හමුව ඉදිරිපත් කිරීම.

ii. මිනිසා දෙවියන් වෙත ළඟා වන්නේ ත්‍රාසයෙන් හා භීතියෙන් යුතුවය.

iii. දේව වචනයට මුල් තැනක් දී කටයුතු කිරීමට අවශ්‍ය බව.

iv. දේව මාලිගාව තුළ පමණක් දේව වන්දනාව සිදුවිය යුතු බව.

v. වන්දි ගෙවීමෙන් පව් කමාව ලැබෙන බව.

08. සෑම දෙයක් පිළිබඳව තීරණ කිරීමට දෙවියන් වහන්සේට ඇති අයිතිය තමන් සතුකර ගැනීම යන අදහස පෙන්වා දෙන්නේ,

i. හොඳ නරක අවබෝධ කර ගැනීමේ ගසින් කෑම මගින් ය.

ii. කායින් ආබෙල් මැරීම මගින් ය.

iii. ජල ගැල්ම මගින් ය.

iv. බාබෙල් කොත මගින්ය.

v. සෙත්ගේ උපත මගින් ය.

09. A - J සම්ප්‍රදාය

B - E සම්ප්‍රදාය

C - D සම්ප්‍රදාය

D - P සම්ප්‍රදාය

ඉහත සඳහන් සම්ප්‍රදායන් තුළින් පීඩා දහය අඩංගු සම්ප්‍රදාය මුලාශ්‍ර සංකලනය තෝරන්න.

i. A,B,C ii. A,C,D iii. B,C,D

iv. A,B,D v. ඉහත සඳහන් සියල්ලම

10. ජුදා පාස්කුව සඳහන් වන ග්‍රන්ථ වනුයේ,

i. උත්පත්ති, නික්මයාම. ලෙවි ව්‍යවස්ථාව

ii. උත්පත්ති, නික්මයාම, ගණන් කතාව

iii. ද්විතී නීති සංග්‍රහය, ලෙවි ව්‍යවස්ථාව, ගණන් කතාව

iv. නික්මයාම, ගණන් කථාව, ලෙවී ව්‍යවස්ථාව

v. උත්පත්ති, නික්මයාම, ද්වීතීය නීති සංග්‍රහය

11. මිනිස් දුබලතා උපයෝගී කරගෙන දෙවියන් ස්වකීය සැලැස්ම ඉදිරියට ගෙන ගිය ආකාරය අවබෝධ කර ගත හැකි වනුයේ කුමන පුද්ගලයා කළ වංචාව තුළින්ද?

i. ආබ්‍රහම්තුමා ii. ජාකොබ්තුමා iii. ඊසාක් තුමා
iv. ජෝශප් තුමා v. මෝසෙස්තුමා

12. පාළුකරයේ අනතුරුවලින් ආරක්ෂා වීම සඳහා ඊශ්‍රායෙල් ජනතාව අනුගමනය කළ ක්‍රියාමාර්ගයකි.

i. රන්වස්සෙකු සෑදීම ii. මෝසෙස්ගේ මැදිහත්කම පැතීම.
iii. දෙවිඳුන්ට කන්නලව් කිරීම. iv. සර්පයා එසවීම
v. පූජාසනයක් ඉදි කිරීම.

13. ඊශ්‍රායෙල් ජනතාව සීනයි ගිවිසුම සඳහා සූදානම් වූ ආකාරයට අදාල කරුණක් නොවන්නේ,

i. ස්ත්‍රී සේවනයෙන් තොරවීම. ii. සියල්ලෝම එක් තැනකට රැස්වව සිටීම.
iii. කන්දෙන් බැහැරව සිටීම. iv. පවිත්‍ර වීම.
v. ඇතුලාන්ත ශුද්ධවත් බවින් සිටීම.

14. දෙවියන් වහන්සේ දාවිත් සමඟ ඇති කරගත් ගිවිසුමේ පොරොන්දුව වනුයේ,

i. දාවිත්ගේ පරපුර සදහටම පවතින බවටද, ආරක්ෂා කරන බවටද, පොරොන්දුවෙයි.
ii. මානව සංහතියේ පැවැත්ම විනාශ නොකරන බවට පොරොන්දු වෙයි.
iii. මිනිස් වර්ගයා ජන්ම පාපයෙන් නිදහස් කරන බවට පොරොන්දු වෙයි.
iv. මිනිස් වර්ගයාට මරණින් මතු ජීවිතයක් ලැබෙන බවට පොරොන්දු වෙයි.
v. පොරොන්දු වූ දේශය හිමිකරදෙන බවට පොරොන්දුවෙයි.

15. උදුරන්න හා කඩා දමන්නටත්, නැති කරන්න හා හෙලා දකින්නටත්, ගොඩනගන්නට හා සිටුවන්නටත් යන වචන දෙවියන් වහන්සේ ප්‍රකාශ කළේ කුමන දිවැසිවරයාගේ කැඳවීමේදී ද?

i. එසකියල් ii. යෙසායා iii. ජෙරමියා iv. දානියල් v. හොසියා

16. දෙවියන් වහන්සේ හා ඊශ්‍රායෙල් ජනතාව අතර ගිවිසුමේ සමීප සම්බන්ධතාවයක් පෙන්වීමට යෙසායා දිවැසිවරයා පෙන්නුම් කරන සංකල්පයක් වන්නේ,

i. එඬේරා හා බැටළුවෝ සංකල්පය
ii. ස්වාමියා හා වෛශ්‍ය, බිරිඳ සංකල්පය
iii. පියපුත් සම්බන්ධතාවේ සංකල්පය
iv. මනාලයා හා මනමාලිය සංකල්පය
v. මිදිවත්ත හා වැවිලිකරුවෝ සංකල්පය

17. ඊශ්‍රායෙල් ජනතාව දේව ගිවිසුම උල්ලංඝනය කළ නිසා ඔවුන්ට ලැබුණු දරුණුම දඬුවම වුයේ,

i. වහල් බවට පත්වීම.
ii. සතුරු ආක්‍රමණවලට මුහුණ දීම.
iii. ආහාර හිඟවීම.
iv. වසංගත වලට මුහුණ දීම.
v. විප්‍රවාසීව විසීමට සිදුවීම.

18. යෙසායා දිවැසිවරයා පවසන ලෙස ස්වාමීන් වහන්සේට කීකරුවන්නන්ට ලැබෙන විපාකය වන්නේ,

i. දේව රැකවරණය
ii. දේශයේ සාරවත්කම බුක්ති විඳීමට ඉඩ ලැබීමය.
iii. මුළුමනින්ම භූමියේ උරුමය ලැබීමය.
iv. දේව වරප්‍රසාදය.
v. සතුරන් පරදවා ජය ගැනීමේ හැකියාව.

19. ජුදෙව් මන්ත්‍රණ සභාව හඳුන්වන තවත් නමක් වන්නේ,

i. සැනෙඩ්‍රින් මන්ත්‍රණ සභාව
ii. එපීස මන්ත්‍රණ සභාව
iii. ජෙරුසලම් මන්ත්‍රණ සභාව
iv. ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව
v. කැල්සිඩොන් මන්ත්‍රණ සභාව

20. තමන් අති විශේෂ ලෙසද අන් අය පව්කරුවන් ලෙසද සලකනු ලැබූ පලස්තීනයේ ජීවත් වූ ආගමික කණ්ඩායමක් වන්නේ,

i. සද්දුසිවරු ය.
ii. හෙරෝදිවරු ය.
iii. පරිසිවරු ය.
iv. සමරිතානුවරු ය.
v. එසීනවරු ය.

21. සම දර්ශක සුවිශේෂ වල අසමානකම් වලට හේතුවන ද්විලේඛන සම්ප්‍රදාය ඉදිරිපත් කළ පුද්ගලයා වන්නේ,

i. එච්. ජේ. හොල්ස්මන්
ii. බුල්ට්මාන්
iii. ජොන්වැමින්
iv. ජේ. හුවයිස්
v. ඔරිගන්

22. මාස්තුමා තම සුවිශේෂය රචනා කර ඇත්තේ,

i. සභා ප්‍රතිසංස්කරණයට පසුවය.
ii. පෙන්තකොස්ත සිද්ධියෙන් පසුවය.
iii. පේදුරුතුමාගේ අභාවයට පෙරය.
iv. ජොහාන් සුවිශේෂය ලියවීමට පසුවය.
v. ජෙරුසලම් දෙව් මැඳුරේ විනාශයට පෙරය.

23. වර්තමානයේ අප පරිහරණය කරන නව ගිවිසුමේ පැරණිම අත්පිටපත වන්නේ,

i. මාක් සුභාරංචිය
ii. ජොහාන් සුභාරංචිය
iii. මතෙව් සුභාරංචිය
iv. ලූක් සුභාරංචිය
v. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොත

24. ජුවාම්තුමාගේ ලකුණු ලෙසින් හඳුන්වන ජේසුස් වහන්සේ කළ හාස්කම් බොහොමයක් මගින් උන්වහන්සේගේ ස්වභාවය පෙන්වා දී ඇති ආරම්භක සළකුණ වන්නේ,

i. ලාසරස් මරණයෙන් නැගිටිවීම.
ii. රාජ්‍ය නිළධාරියාගේ පුත්‍රයා සුව කිරීම.
iii. ගලීලයේ කානා නුවර සිදුකළ ප්‍රාතිහාර්ය
iv. බෙත්සයිදාවේ කොරවූ පුද්ගලයා සුවකිරීම.
v. පන්දහසකට කෑම දීමේ ප්‍රතිහාර්ය.

25. මාක් සුවිශේෂයට අනුව ක්‍රිස්තුන් වහන්සේ තමන්ගේ ස්වකීය මරණය පිළිබඳව කලින් දැනුම් දුන්නේ,

i. බෙතානියේදී ය.
ii. ගලීලයේදී ය.
iii. නාසරතේ දීය.
iv. බෙත්සයිදාවේ දී ය.
v. සමාරියාවේදීය.

26. තමන් වහන්සේට විරුද්ධව කළ චෝදනා වලදී ජේසුස් වහන්සේ නිහඬව සිටියේ ඇයි?

i. නායක පූජකයන් ඉදිරියේ තම නිර්දෝෂී බව ඉදිරිපත් කිරීම ඵලක් නැති බැවින් ය.

ii. තමා ගැන සාක්ෂි දැරීමට කිසිවකු ළඟ නොසිටි බැවින්ය.

iii. තමන් නිදහස් නොකරන බවට තේරුම් ගත් බැවින්ය.

iv. දේව කැමැත්තට අවනත වීම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට වඩා වැදගත් වූ බැවින්ය.

v. දෙවියන් වහන්සේ තමන් මත පැට වූ බර වේදනාකාරී වූ බැවින්ය.

27. (මාක් 15 / 39) සදහන් වන 'සැබවින්ම මොහු මනුෂ්‍ය පුත්‍රයාණෝය.' යන්න විජාතික ශතාධිපතියාගේ පැවසීම තුළින් ප්‍රකාශ වන්නේ,

i. ක්‍රිස්තුන් වහන්සේගේ බල පරාක්‍රමයේ මහිමය ප්‍රකාශ වීමයි.

ii. ක්‍රිස්තුන් වහන්සේ මරියතුමියගේ පුත්‍රයා බව ප්‍රකාශ වීමයි.

iii. ස්වර්ග රාජ්‍යයේ දොරටුව විවෘත වීමේ ආරම්භයයි.

iv. ක්‍රිස්තුන් වහන්සේ සකල මනුෂ්‍යයාගේ ගැලවුම්කාරයා බව ප්‍රකාශ වීමයි.

v. ක්‍රිස්තුන් වහන්සේගේ සුභ අස්න ප්‍රකාශ වීමේ ආරම්භයයි.

28. ක්‍රිස්තුන් වහන්සේගේ දූත කාර්යය පිළිබඳව උත්තම පූජක යැදුමෙන් කියවෙන්නේ,

i. සභා ඒකත්වය, සාධාරණත්වය සහ ඒකත්වය

ii. ඒකත්වය, සභා ඒකත්වය සහ දූත කාර්යයේ පූර්ණත්වය

iii. ඒකත්වය, ශුද්ධත්වය සහ සාධාරණත්වය

iv. ශුද්ධත්වය, සාධාරණත්වය සහ දූත කාර්යයේ පූර්ණත්වය

v. ඒකත්වය, සභා ඒකත්වය සහ සාධාරණත්වය

29. (ජුවාම් 20 /29) 'නොදුටු නමුත් අදහන්නෝ' යන්නෙන් අදහස් කරනු ලබන්නේ,

i. ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රාවකයන් පිළිබඳවය.

ii. අන්‍ය ජාතීන් පිළිබඳවය.

iii. ප්ලිනි හා ජෙරොම්තුමාය.

iv. ජුදා ජාතීන් පිළිබඳවය.

v. චර්මජේ දිතයින් පිළිබඳවය.

30. ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය ඓතිහාසික සිදුවීමක් බව ලේඛනගත කර ඇත්තේ,

i. ජොසපස් හා ප්ලිනින්ය.

ii. එව්සේබියස් හා පැම්ට්‍රිෂියස්ය.

iii. අනාගත විශ්වාසිකයින් පිළිබඳවය.

iv. සිරිල්තුමා හා ජෙරොම් තුමාය.

v. සෙලෙස්ටින් හා ප්ලිනින්ය.

31. 'අන්තිම දවසේදී සියල්ලන් මත මම මාගේ ආත්මය වගුරන්නෙමි' යන්න ප්‍රකාශ කරමින් ශුද්ධාත්ම ආගමනය ගැන තහවුරු කරනු ලැබූ දිවැසිවරයා වන්නේ,

i. ආමොස් දිවැසිවරයාය. ii. ජෙරමියා දිවැසිවරයාය. iii. මීකා දිවැසිවරයාය.

iv. ප්ලිනි හා ජෙරොම්තුමාය. v. සෙලෙස්ටින් හා ප්ලිනින්ය.

32. ස්තේපන්ගේ වේද සාක්ෂි මරණයෙන් පසු ජෙරුසලමෙන් පිටතට ගිය සභාවේ ප්‍රථම ධර්මදූත මෙහෙකරුවන් වූයේ,

i. හේබ්‍රෙව් බස කතා කරන ජුදෙව්වරුන්ය
ii. ලතින් බස කතා කරන ජුදෙව්වරුන්ය.
iii. ක්‍රිස්තු ශ්‍රාවකයන්ය.
iv. ග්‍රීක බස කතාකරන ජුදෙව්වරුන්ය.
v. අන්‍ය ජාතිකයන්ය.

33. පෙන්තකොස්ත දින ශුද්ධාත්මයාණන්ගේ පැමිණීම තුළ එකසිය විසිදෙනකුගේ ශ්‍රාවකත්වයෙන් ඇරඹී සභාවේ වර්ධනය මුළු ලොව පුරා ව්‍යාප්ත වීම ප්‍රකාශ කරන ශුද්ධ බයිබලයේ සඳහන් උපමාවක් වන්නේ,

i. වපුරන්ගේ උපමාවය
ii. අඹ ඇටයේ උපමාවය
iii. නිධානය පිළිබඳව උපමාවය
iv. නැති වූ කාසිය පිළිබඳ උපමාවය
v. නැති වූ බැටළුවා පිළිබඳ උපමාවය

34. නෙස්ටෝරියස්ගේ දුර්මත නිසා තියෝඩෝසියස් අධිරාජ්‍යයා ගැටලු විසදා ගැනීම සඳහා පාප්තුමාට දන්වා ක්‍රි.ව. 431 දී කැඳවූ මන්ත්‍රණ සභාව වන්නේ,

i. නයිසීන මන්ත්‍රණ සභාව
ii. කොන්ස්තන්නෝපලයේ මන්ත්‍රණ සභාව
iii. එපීසියේ මන්ත්‍රණ සභාවය
iv. කැල්සිඩොන් මන්ත්‍රණ සභාව
v. ජෙරුසලම් මන්ත්‍රණ සභාව

35. මධ්‍යතන යුගයේ යුරෝපයේ පැවැති ඉතා ධනවත්ම තාපසාරාමය වන්නේ,

i. ක්ලිනි තාපසාරාමය
ii. බෙනදිකාන තාපසාරාමය
iii. අගොස්තීනු තාපසාරාමය
iv. නිර්මල මරිය නිකාය තාපසාරාමය
v. ජේසු නිකාය තාපසාරාමය

36. (ක්‍රි.ව. 1033 - 1109) දේවධර්මයට අර්තකතනයක් ඉදිරිපත් කරමින් දේවධර්මය යනු 'අවබෝධය සොයා යන ඇදහිල්ලක්' ලෙස හඳුන්වා දුන්නේ,

i. ජොන් ක්‍රිසෙස්ටම්තුමාය.
ii. දෙවන උර්බාන් පාප්තුමාය
iii. අටවන බෙනඩික්ට් තුමාය.
iv. ශුද්ධ වූ පැට්‍රික් තුමාය.
v. කැන්ටබරිහි ශුද්ධ ඇන්සලම් තුමාය.

37. අයිකොන් චිත්‍රයට විශිෂ්ඨතම නිදසුන වශයෙන් ශ්‍රී ලංකාවේ අතිශයින් ජනප්‍රියට පත් වී ඇත්තේ,

i. අන්තිම රාත්‍රි භෝජන සංග්‍රහය චිත්‍රය
ii. ජේසුස් වහන්සේගේ කුරුසය ගත වීමේ චිත්‍රය
iii. ආදම් සහ ඒවගේ චිත්‍රය
iv. සදා සරණ දේවමාතා චිත්‍රය
v. ජේසුස් වහන්සේ හා ගෝලයන් දක්වන චිත්‍රය

38. ක්‍රි.ව. 1931 දී කැනීම් වලින් සොයාගෙන ඇති ඩූරා යුරෝපස් හි නිවෙසක රෝමයේ පිහිටා ඇති දොමිනිල්ලාගේ සොහොන් ගැබෙහි තිබූ චිත්‍රවලට තේමා වී ඇත්තේ,

i. ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය

ii. ශුද්ධ බයිබලයේ අඩංගු කතාන්දරය.

iii. දෙවියන් වහන්සේ විශ්වය මැවීමය.

iv. ජේසුස් වහන්ගේ පාළුකරයේ පරීක්‍ෂණය

v. මුල් කිතුනුවන් භාවිතා කළ සංකේතය

39. 11 වන පියුස් ශුද්ධොත්මක පියතුමා ඉතාලියේ රජය සමග 1929 පෙබරවාරි 11 දින ඇතිකරගත් ලතරානු ගිවිසුමේ අදහස වන්නේ,

i. සියලුම ජනතාවට තම දහම ඇදහීමේ නිදහස දිය යුතුය යන්නය.

ii. තරුණයන්ට කතෝලික අධ්‍යාපනය ලබාදීම සභාවේ අයිතිය යන්නය.

iii. නිදහස් සීමාවක නිදහසේ පාලනය කිරීම ශුද්ධ වූ සභාවේ සැබෑ නිදහස යන්නය.

iv. සමාජයේ යහපත සඳහා කම්කරුවන් කටයුතු කළ යුතුය යන්න.

v.කිතුනු ඒකත්වය සඳහ ාසියලු දෙනාම ක්‍රියාත්මක විය යුතුය යන්න.

40. 'අදණ්ඩනාවසරය' යන්නෙහි අදහස වන්නේ,

i. යම් යම් පාපවලට නියමිත දඩුවම් වලින් සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් නිදහස් කිරීමයි.

ii. යම් යම් පාපලට නියමිත දඩුවම් වලින් සම්පූර්ණ හා අර්ධ වශයෙන් මුදල් මත නිදහස් කිරීමය.

iii. සභාවේ අනියම් ක්‍රියා හෙලිකරමින් සභානායකයන් නෙර පා දැමීමය.

iv. පාපයන්ට මනස්ථාපනය වී දේව වරප්‍රසාද ලබා ගැනීමට පෞද්ලිකව කටයුතු කිරීමය.

v. තම තමන්ගේ පාපයන්ට යාච්ඤාවෙන් හා උපවාසයෙන් වන්දි ගෙවිය යුතු බවය.

41. කතෝලික විශ්වාසය ආරක්ෂා කිරීමෙහිලා දිවි පිදූ ප්‍රාණ පරිත්‍යාගිවරයකු බවට පත් වූයේ,

i. ජෝන් ෆිෂර් තුමාය. ii. අටවන බෙනඩික් තුමාය. iii. ඇන්සලම් තුමාය.
iv. හත්වන ක්ලෙමන්ට් පාප්තුමාය v. සර් තෝමස් මුවර්ය.

42. ක්‍රි.ව. 1000 සිට 1500 දක්වා කාලය මධ්‍යතන යුගයේ දී ක්‍රිස්තියානි අනන්‍යතාවෙන් යුතුව ගොඩ නැගූ දේවස්ථාන ගොඩනැගිලි ක්‍රමයක් වන්නේ,

i. අයිකොන් දේවස්ථානය

ii. පැරිස් දේවස්ථානය

iii. පියෙටා දේවස්ථානය

iv. ගෝතික දේවස්ථානය

v. මොසැයික් දේවස්ථානය

43. ලක්දිවට පෘතුගීසීන් පැමිණෙන විට එවකට සසුන් එඬේරාණන් ලෙස සේවය කළේ,

i. තුන්වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා

ii. දෙවන ජුලියස් ශුද්ධෝත්තම පියතුමා

iii. එකලොස් වන පියුස් ශුද්ධෝත්තම පියතුමා

iv. දහතුන්වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා

v. විසිතුන් වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා

44. 16 වන සියවසේ රෝමයේ ආරම්භ කරන ලද ඔරතෝරියානු නිකායේ ආරම්භකයා වන්නේ,

i. වින්සන් රොසයිරෝ පියතුමා
ii. ඔරාෂියෝ බැටිකිනි පියතුමා
iii. සා. පිලිප්නේරිතුමා
iv. අන්තෝනියෝ කයිතානෝ පියතුමා
v. ක්‍රිස්ටෝපර් බොන්ජන් පියතුමා

45. මෑත ඉතිහාසයේ මෙරට කතෝලික දයා සරණ සේවා හා සමාජ සංවර්ධන සුභ සාධන කටයුතු නිරීක්ෂණය කිරීමේදී ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලය යටතේ ක්‍රියාත්මක සමාජ සේවා ආයතනය වන්නේ,

i. කාරිටාස් (ශ්‍රී ලංකා) සෙඩෙක්ය.
ii. තරුණ ක්‍රිස්තියානි සංගමය
iii. ධර්මදූත සේවාවය
iv. සාන්ත වින්සන්ද පාවුලා දයා සේවය
v. ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය

46. ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා ලියූ ග්‍රන්ථ අතරින් ගීත ප්‍රබන්ධයක් නොවන්නේ,

i. වේද කාව්‍යය
ii. පසන් පොත
iii. ආනන්ද කලිප්පුව
iv. ලතෝනි පොත
v. ඥානාංජනය

47. ශුද්ධ වූ සභාවේ ක්‍රියාකාරිත්වයේ 'හිනිපෙත' සහ ශුද්ධ වූ සභාවේ මුළු ශක්තිය ගලා එන උල්පත වනුයේ,

i. ශුද්ධාත්මයාණෝය
ii. ක්‍රිස්තුන් වහන්සේය.
iii. යාච්ඤාවය
iv. ජනවන්දනාවය
v. ප්‍රසාද නිධානය

48. දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ප්‍රකාශන අතරින් ප්‍රථමයෙන් එළිදුටුවේ,

i. සභාව පිළිබඳ ධර්ම ව්‍යවස්ථාව
ii. සභා එකමුතුව පිළිබඳ නියෝගය
iii. ජනවන්දනාව පිළිබඳවේද සත්‍ය ව්‍යවස්ථාව
iv. පෙරදිග කතෝලික සභාවන් කෙරෙහි නියෝගය
v. ආගමික නිදහස පිළිබඳ ප්‍රකාශය

49. සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකායේ ධර්ම දූත සේවය ශ්‍රී ලංකාව තුළ ආරම්භ කළ වර්ෂය හා පියනම වන්නේ,

i. ක්‍රි.ව. 1878 දී හිලේරියන් සිල්ලානි පියතුමාය.
ii. ක්‍රි.ව. 1845 දී ජෝශප්බ්‍රාවි පියතුමාය.
iii. ක්‍රි.ව. 1856 දී ක්‍රිස්ටෝපර් බොන්ජන් පියතුමාය.
iv. ක්‍රි.ව. 1846 ඔරාෂියෝ බැටකිනි පියතුමාය.
v. ක්‍රි.ව. 1843 දී කයිතානෝ අන්තෝනියෝ පියතුමාය.

50. ක්‍රි.ව. 1887 වන විට සිරිලක කතෝලික සභාව රදගුරු පදවි තුනක් ලෙස සංවිධානය විය. මහනුවර පදවිය පාලනය භාර වූයේ,

i. බෙනදිකාන පියවරුන්ටය.
ii. ජේසුනිකාය පියවරුන්ටය.
iii. ප්‍රැන්සිස්කාන පියවරුන්ටය.
iv. අගොස්තීනු නිකායේ පියවරුන්ටය.
v. නිර්මලමරිය නිකායේ පියවරුන්ටය.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

43 S II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

Second Term Test - Grade 13 - 2018

විභාග අංකය .............................

# ක්‍රිස්තු ධර්මය II

කාලය පැය තුනයි

වැදගත්

I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

## I කොටස

01. i. ක්‍රි.පූ. 922 දී උත්තර හා දක්ෂිණ ලෙස දෙකඩ වූ ඊශ්‍රායෙලයේ දක්ෂිණ රාජ්‍යයේ පිළිබඳ කරුණු හතරක් ලියන්න.

ii. මාක් 16 / 9 - 20 අනුව උත්ථානයෙන් පසු දර්ශනය වීමෙහි සඳහන් ප්‍රධාන කරුණු හතරක් ලියන්න.

iii. දෙවන මැවීමේ කතාවේ දෙවියන් වහන්සේව දක්වා ඇති ආකාර හතරක් ලියන්න.

iv. මුල් යුගයේ සභාව වර්ධනය වූයේ සාමාජික සංඛ්‍යාවෙන් සහ කිතුනු සමූහයන්ගෙන් පමණක් නොවේ. සභාව වර්ධනය වීමට බලපෑ තවත් කරුණු හතරක් ලියන්න.

v. ක්‍රිස්තියානි සභා ඉතිහාසයේ විවිධ කාල වකවානුවල දී කලාවේ උන්නතිය සඳහා සභාවේ දායකත්වය ලැබූ අංශ හතරක් ලියන්න. (ලකුණු 4 x 5 = 20)

02. i. දසපනත ලබා ගැනීමට සීනයි කන්දට නැගි පුද්ගලයින් හතර දෙනෙක් නම් කරන්න.

ii. ජුදා සමාජීය පසුබිම තුළ ආගමික කණ්ඩායම් අතර තිබූ ආගමික නීතියේ ලක්ෂණ හතරක් ලියන්න.

iii. ජුවාම් තුමා පෙන්වන ආකාරයට පිලාත් ඉදිරියේ නඩු තීන්දුව නාට්‍යමය ස්වරූපයෙන් දක්වන පියවර හත තුළින් පෙන්නුම් කරන කරුණු හතරක් ලියන්න.

iv. ලන්දේසී යුගයේ දී පැවැති සතරාකාර පාසල් ක්‍රම හතරක් ලියන්න.

v. බ්‍රිතාන්‍ය යුගයේ දී උදා වූ ආගමික නිදහසින් උපරිම ලෙස ප්‍රයෝජන ගනු සඳහා ඔරතෝරියානු පියවරු සංවිධානය කළ කාර්යයන් හතරක් ලියන්න. (ලකුණු 4 x 5 = 20)

03. i. නව ගිවිසුමේ මාක්තුමා පිළිබඳ සඳහන් වන ස්ථාන හතරක් ලියන්න.

ii. ස්වාමිවාක් ආරාධනය හා උත්තම පුජක යැදුම අතර සමාන ලක්ෂණ හතරක් ලියන්න.

iii. සභා පිය යුගයේදී ඔවුන්ගේ කෘති ලේඛන ගත කිරීම සඳහා භාවිතා කළ භාෂාව අනුව ඔවුන් ග්‍රීක හා ලතින් පියවරු ලෙස හඳුන්වා දී ඇත. ග්‍රීක සභා පියවරු හතර දෙනෙක් නම් කරන්න.

iv. 13 වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා එකල වූ දූෂණ කෙරෙහි තම සිත යොදවා ශුද්ධ වූ සභාවට මග පෙන්වීමට යොදාගත් විශ්ව ලේඛන හතරක් ලියන්න.

v. ගොන්සාල්වෙස් පියතුමා වූ කලී සහජ කුසලතා රැසකින් පිරි ඉතා විරල ගණයේ පුද්ගලයකු ලෙස හැඳින්වීමට හේතු වූ කරුණු හතරක් ලියන්න. (ලකුණු 4 x 5 = 20)

## II කොටස

04. i. ක්‍රිස්තුස් වහන්සේගේ කාලයේ පලස්තීනයේ දේශපාලනය, ආර්ථිකය හා නීතිය ක්‍රියාත්මක වූ ආකාරය වචන 150 කින් පමණ විස්තර කරන්න.

ii. ශුද්ධවර ලූක්තුමාගේ සුභාරංචිය තුළ ගැලවීම විශ්වීය වන බවට සාධක ඉදිරිපත් කරමින් අන්‍ය ආගමිකයින් වෙත ඔබ සුභාරංචිය ගෙන යන ආකාරය කරුණු පහකින් ඉදිරිපත් කරන්න.

(ලකුණු 10 x 2 = 20)

05. i. විප්‍රවාසීව සිට ජනතාවට බලාපොරොත්තුවක් ධෛර්යයක් සපයන අයුරින් යෙසායා මෙසියස්වරයා කෙබඳු අයකුවේදැයි ගීත හතරකින් ඉදිරිපත් කර ඇත. එම ගීත හතර ලියා සිව්වන ගීය (යෙසායා 52 /13-53/12) ඇසුරින් සැබවින්ම දුක් විඳින සේවකයා කවුද? යන්න කරුණු පහතින් විස්තර කරන්න.

ii. දිවැසිවර කැඳවීමේ පොදු ලක්ෂණ පහ ලියා ප්‍රසාද ස්නාපනය තුළින් ඔබ ලද දිවැසිවර කැඳවීම වර්තමාන සමාජය තුළ ක්‍රියාවට නංවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10 x 2 = 20)

06. i. මුල් යුගයේ කිතුනු ලේඛකයකු සභා පියකු වශයෙන් නම් කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු හතර ලියා මුල් කිතුනු ලේඛකයන් පියවරුන් ලෙස හඳුන්වන්නේ ඇයිද? යන්න පැහැදිලි කරන්න.

ii. ශුද්ධ පාවුළුතුමාගේ ධර්මදූත චාරිකා තුන අධ්‍යනය කරන විට එතුමා ලැබූ අභියෝග හා එතුමාගේ කැපවීම ඔබගේ ජීවිතයට මඟපෙන්වීමක් ලෙස ගනිමින් වර්තමාන සභාව තුළ ඔබ ක්‍රියා කරන ආකාරය කරුණු පහක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10 x 2 = 20)

07. i. ප්‍රතිසංස්කරණවාදී සභාවල ඉගැන්වීම්වලට පිළිතුරු දීම සඳහා ක්‍රි.ව. 1545 දී කතෝලික සභාවේ තුන්වන පාවුලු ශුද්ධෝත්තම පියාණන් විසින් කැඳවූ මන්ත්‍රණ සභාව නම් කර එහි අරමුණ ලියා එම සභාවේදී ගත් තීරණ පහක් ලියන්න.

ii. කිතුනු විද්‍යාඥයින් පස්දෙනෙකු නම් කර විද්‍යාව හා තාක්ෂණික දියුණුව උදෙසා ඔවුන් දායක වූ ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 10 x 2 = 20)

08. i. නිදහසින් පසු දූත සේවයේ නිරත වීමේදී කිතුනු සභාවට මුහුණ පෑමට සිදු වූ ප්‍රධාන ගැටළු හතරක් විස්තර කරන්න.

ii. මෙරට කතෝලිකයින් වෙනුවෙන් තම ජීවිතයම කැපකර උදාර දහම් සේවයට ඇප කැප වූ කිතුනු වීරයකු ලෙස ජුසේවාස් පියතුමාගේ ජීවිතය තුළින් ඔබට ගත හැකි ආදර්ශ පහක් පෙන්වා දෙන්න.

(ලකුණු 10 x 2 = 20)

# දෙවන වාර පරීක්ෂණය - 2018
# ක්‍රිස්ත්‍රියානි ධර්මය - 13 ශ්‍රේණිය.
## I පත්‍රය
## පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 2 | 21. | 4 | 31. | 5 | 41. | 5 |
| 2. | 3 | 12. | 4 | 22. | 5 | 32. | 4 | 42. | 4 |
| 3. | 1 | 13. | 2 | 23. | 2 | 33. | 2 | 43. | 2 |
| 4. | 4 | 14. | 1 | 24. | 3 | 34. | 3 | 44. | 3 |
| 5. | 5 | 15. | 3 | 25. | 1 | 35. | 1 | 45. | 1 |
| 6. | 3 | 16. | 4 | 26. | 4 | 36. | 5 | 46. | 5 |
| 7. | 5 | 17. | 5 | 27. | 5 | 37. | 4 | 47. | 4 |
| 8. | 1 | 18. | 2 | 28. | 2 | 38. | 2 | 48. | 3 |
| 9. | 4 | 19. | 1 | 29. | 3 | 39. | 3 | 49. | 2 |
| 10. | 3 | 20. | 3 | 30. | 1 | 40. | 1 | 50. | 1 |

(ලකුණු 1X2=100)

# ක්‍රිස්ත්‍රියානි ධර්මය - 13 ශ්‍රේණිය.
## II පත්‍රය
### I කොටස

01. i. දක්ෂිණ රාජ්‍ය ජුදා රාජ්‍යය / දක්ෂිණ රාජ්‍යයෙහි පාලනය රෙහෙබොවාම් රජුට හිමිවිය / ගෝත්‍ර දෙකක් එහි පදිංචි වී සිටියහ. එහි අගනුවර ජෙරුසලමය. (12 ශ්‍රේණිය ගු.ම. පිටුව 14)

ii. මරිය මග්දලෙනාට දර්ශනය වීම, ශ්‍රාවකයින් දෙදෙනෙකුට දර්ශනය වීම. ධර්ම දූත සේවාව පැවරීම. ස්වර්ගාරෝහණය (12 ශ්‍රේණිය ගු.ම. පිටුව 74)

iii. යාවේ කුඹල්කරුවෙකු ලෙස, උයන් ගොවිවෙක් ලෙස, ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස සන්නාලියකු ලෙස (12 ශ්‍රේණිය ගු.ම. පිටුව 19)

iv. ඇදහිලිවන්තයන්ගේ ජීවිත. පරිපාලන ව්‍යුහය, නමස්කාර විධි, දේව ධර්මය, ආගමික අධ්‍යාපනය (13 ශ්‍රේණිය ගු.ම. පිටුව 15)

v. කිතුනු ලේඛනය, කිතුනු සංගීතය, ගෘහ නිර්මාණ, චිත්‍ර, කැටයම්, මූර්ති (13 ශ්‍රේණිය ගු.ම. පිටුව 94) (ලකුණු 4X5=20)

02. i. මෝසෙස්, ආරොන්, නාදාබ්, අභිහුම්, ඊශ්‍රායෙල්වරුන්ගේ ප්‍රජා මූලික 70 දෙනා (12 ශ්‍රේණිය ගු.මා. පිටුව 35)

ii. ජුදා ජන ජීවිතයේ මූලික නීති පද්ධතිය හා සම්බන්ධ වීම.
තෝරාගත් ජනතාවය කළ යුතු හා නොකල යුතු සියල්ල අඩංගු වීම.
සබත් නීතිය ප්‍රමුඛ වීම.
සබත් දවසේ වෙනත් ලෞකික කාර්යයන්ගෙන් බැහැරව ආගමික කටයුතු පමණක් ඉටු කිරීම. (12 ශ්‍රේණිය පිටුව 52)

iii. ක්‍රිස්තුස් වහන්සේලා බලය, ක්‍රිස්තුස් වහන්සේගේ නිදොස් බව, ජුදා නායකයන්ගේ සාවද්‍ය බව, පිලාත්ගේ සාවද්‍ය බව (12 ශ්‍රේණිය පිටුව ගු.ම. 77)

iv. දේවස්ථානයට අනුබද්ධිත පාසල්, දෙවිසත්හල්, ලන්දේසී පාසල්, අනාථ නිවාස (13 ශ්‍රේණිය පිටුව ගු.ම. 141)

v. සභාවට අයිති දේපල නැවත ඉල්ලා සිටීම, සභාවේ කටයුතු පුනරුත්ථාපනය කිරීම, කැඩී බිඳී ගිය දෙව්මැදුරු නැවත ගොඩ නැගීම, කිතුනු වත්පිළිවෙත් සංවිධානය කිරීම, මෙරට කිතුනු ජනයා ඒකරාශී කිරීම. (13 ශ්‍රේණිය පිටුව ගු.ම. 120)

(ලකුණු 4 x 5=20)

03. i. මාක්තුමා කැටුව බර්නස් සයිපස් බලා ගියේය. (ක්‍රියා 15 /36 - 39)
පාවුළුතුමා කොලොස්සිවරුන්ට යැවූ හසුනේ මාක්තුමා සමඟ සිටින බව (කොලොස්සි 4 /10)
විශ්වාසවන්ත සේවකයකු බව (පිලමොන් 24)
පේදුරු සමඟ සිටින බව (1 පේදුරු 5 /13)
'මාගේ පුත්‍රයා මාක්' පේදුරුගේ ප්‍රකාශය ( 1 පේදුරු 5 / 13) (12 ශ්‍රේණිය පිටුව ගු.ම. 57)

ii. පියාණනි යනුවෙන් දෙවිඳුන් ඇමතීම, දේව ප්‍රශංසාව හා දේව නාමය ඇයදීම.
දේව කැමැත්ත ඉටු කිරීම, නපුරාගේ බලයෙන් මුදාගනු පිණිස යැදීම. (12 ශ්‍රේණිය පිටුව ගු.ම. 76)

iii. ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල්තුමා, බැසිල්තුමා, ජොන් ක්‍රිසොස්ටම්තුමා ඇතනේසියස්තුමා, ග්‍රෙගරි නසිසන්සස්තුමා, ඉන්නාසියුස්තුමා (13 ශ්‍රේණිය පිටුව ගු.ම. 53)

iv. විශ්වාසය හා බුද්ධිවාදය, ශුද්ධ වූ සභාව හා රජය, සමාජවාදය භායානක බව, විවාහයේ ශුද්ධත්වය, අයිතිය හා බලය, කම්කරු අයිතිවාසිකම්. (13 ශ්‍රේණිය පිටුව ගු.ම. 87)

v. තීක්ෂණ බුද්ධිය, භාෂා හැදෑරීමේ කුසලතාවය, සංගීත ඥානය, ලේඛන දක්ෂතාවය (13 ශ්‍රේණිය පිටුව ගු.ම. 117)

(ලකුණු 4 x 5=20)

## II කොටස

04. i. **දේශපාලනය**

- ග්‍රීක අධිරාජ්‍ය බිඳ වැටීම හා රෝම අධිරාජ්‍යයේ පිබිදීම.
- රෝම අධිරාජ්‍යයා බලගු වූ සීසර් අධිරාජ්‍යයාගේ පාලනය
- ජුදෙව් ජනතාවට රෝමවරුන් යටතේ ආගමික නිදහස හිමිවීම.
- ආණ්ඩුකාරවරුන් පත්කිරීම.
- ගලීලය, ජුදයාව, සමාජීය ලෙෂ බෙදා වෙන්වීම හා පාලනය යුව රජවරු වීම.
- ජුදා පූජක නායකයින්ටද යම් බලයක් හිමිවීම.
- අයබදු ක්‍රමයක් පැවැත්වීම.

**ආර්ථික**

- ආර්ථික වෙලදාම මත පදනම් වීම.
- සමාජ පරතරයක් පැවැතීම.
- වහල් වෙළදාම පැවැතීම.
- බදු අයකිරීම නිසා දුගී ජනයා සූරා කෑම.

**නීතිය**

- රෝම නීතිය හා කුරුසියේ මරණය
- කුරුස පත් කිරීමේ බලය රෝම අධිරාජ්‍යයා සතුවීම.
- ජුදා ආගමික නීතිය අනුව කුරුස පත්කිරීම බලය නායක පූජකයන්ට නොමැත.

(ඉහත සදහන් කරුනු ඇතුලත්ව විස්තර කර ඇත්නම් ලකුනු ලබා දෙන්න.) (12 ශ්‍රේණිය පිටුව ගු.මා. 50, 51 )

ii. දෙවියන් වහන්සේගේ ගැලවීම විජාතීන්ට එළිය දෙන ආලෝකය ලෙස පෙන්වාදෙයි.
සුභාරංචිය සකළ මිනිස් සංහතියටම යන අදහස විස්තර කරයි.
සමාරියන් අතරට පවා ජේසුස් වහන්සේගේ සේවාව විහිදී යාම.
පව්කරුවන්ට, වැන්දඹුවන්ට, කාන්තාවන්ට, කුඩා දරුවන්ට, රෝගීන්ට, විශේෂ අවධානයක් යොමු කිරීම.
(සිසුන් ඉදිරිපත් කර ඇති කරුණු අනුව ලකුනු දෙන්න.) (12 ශ්‍රේණිය පිටුව ගු.ම. 58)

05. i. පළමු ගීය (යෙසායා 42 /1 - 4)
දෙවන ගීය (යෙසායා 49 /1 - 6)
තෙවන ගීය (යෙසායා 50 /4 - 9)
සිව්වන ගීය (යෙසායා 52 /13 - 53/12) (12 ශ්‍රේණිය ගු.මා. 45,46 පිටු).

**සිව්වන ගීය (යෙසායා 52/13 -53/12) අනුව දුක් විඳින සේවකයා.**

- ද්විතියික යෙසායායා - සජීවීම තමන් දුක්වේදනා පැහැදිලි කිරීම.
- ඊශ්‍රායෙල් ජනතාව - තෝරාගත් ජනතාව අන්‍යජාතීන් විසින් පීඩාවට පත්කිරීම.
- තනි පුද්ගලයකි - රචනා ශෛලය අනුව තනි පුද්ගලයකි.
- සමූහික පෞද්ගලිකත්වයකි - මුළු මහත් ජනතාවගේම දුක් කරදර එක පුද්ගලයකු තුළ
- අවිහිංසාවාදී ජීවිත ක්‍රමය

ඉහත කරුණු අනුව පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 10)

ii. දිවැසිවර කැඳවීමේ පොදු ලක්ෂණ පහ

1. දර්ශනය හෝ විශේෂ අත්දැකීම.
2. කැඳවීම භාර දීම.
3. දිවැසිවරයාගේ අකමැත්ත ප්‍රකාශ කිරීම.
4. ධෛර්යමත් කරනු ලැබීම.
5. යවනු ලැබීම. (12 ශ්‍රේණිය ගු.මා. පිටුව 41)

- දෙවියන් වහන්සේ අපට බාර දෙන වගකීම් හා යුතුකම් ඉටු කිරීමට ස්වාමින් වහන්සේගෙන් බලවත් විය යුතුය.
- කාලයේ සලකුණු මගින්. විශේෂ පුද්ගලයන් තුලින් කැඳවීම ලබයි.
- දේව කැමැත්තට අවනත වී කැඳවීම භාර ගැනීම, කිසිවිටක මැලිනොවීම.
- දේව වචනයට පිටු පා කටයුතු කරන අයට දේව වචනය අනුව ජීවත් විය යුතු ආකාරය පහදා දීම.
- දහම් පාසල් වල ඉගැන්වීම, ගිහි දූත සේවාවල යෙදීම, දේව ධර්මය හැදෑරීම, ජනමාධ්‍ය භාවිතය, බයිබල් පාඨමාලා පැවැත්වීම ආදී මගින් ගිහි අපොස්තලිත සේවාවල යෙදීම.

(සිසුවා ලියා ඇති කරුණු ගැන සලකා බලා ලකුනු දෙන්න) (ලකුණු 10) (ලකුණු 10 x 2 = 20 යි)

06. i. ඉදිරිපත් කළ ධර්මයේ නිරවද්‍යභාවය, ශුද්ධවත් ජීවිතය, ශුද්ධ වූ සභාවේ අනුමැතිය ජීවත් වූ කාල වකවානුව

- පියතුමා යන වචනය කතෝලික සභාවෙන් නිකුත් වූවකි.
- රදගුරුතුමකු ගෞරවාන්විතව හැඳින්වීම සඳහා යොදා ගනියි.
- අධ්‍යාත්මික පෞරුෂත්වය ගොනගනන ගුරුතුමා පියා ලෙස සලකයි.
- සභාවේ ඉගැන්වීමේ කාර්යය පැවරෙන රදගුරුවරුන්ද පියා යන නමින් හඳුන්වයි.
- සභාවේ මුල් කිතුනු ලේඛකයන්ගේ කාර්යය කිතුනු ධර්මය ඉගැන්වීම් නිසා ඔවුන් පියවරු ලෙස හඳුන්වයි.
- මේ සභා පියවරු ග්‍රීක හා ලතින් ලෙස ලේඛන ගත කළ භාෂාව අනුව වෙන් කර ඇත.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් සිසුන් ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න.

(13 ශ්‍රේණිය ගු.මා. පිටුව 51) (ලකුණු 10)

ii. **අභියෝග**

- ජුදෙව්වන් පාවුළුතුමාට ගල් ගසා නුවරින් පිටතට දැමීම.
- පාවුලුතුමා හා සීලස් සිරගත කිරීම.
- පුදෙව්වරුන්ගේ විරෝධතාවලට ලක්වීම.

**කැපවීම.**

- සුභ අස්න නොඇසූ අයට සුබ අස්න දේශනා කිරීම, එක් එක් සභාවන් සඳහා සභා මූලිකයන් පත් කිරීම, ක්‍රිස්තුන් වහන්සේලා තුළ නව ජීවිතය පවත්වා ගැනිමට ඔවුන්ගේ සිත් හැරවීම. සබාවන් තුළ විවිධ ගැටළු නිරාකරණය කිරිමට සංදේශ ලිවීම.

(ඉහත කරුණු ඇතුලත්ව සිසුවා ලියා ඇති කරුනු වලට ලකුණු දෙන්න.) (13 ශ්‍රේණිය ගු.මා. පිටු 18,19,20,21)

(ලකුණු 10 x 2 = 20 යි)

07. i. ත්‍රිදෙන්තීහු මන්ත්‍රණ සභාව

කතෝලික සභාවේ ඒකීය තීරණ හා ධාර්මික පදනම ප්‍රසිද්ධ කිරීම.

- ශුද්ධ බයිබලය, සම්ප්‍රදාය යන දෙකම ධාර්මික සත්‍යතාවයන්හි උල්පත වන්නේය.
- දේශන කිරීමේ බලයත්, ඉගැන්වීමේ බලයත් ශුද්ධ වූ සභාවට ක්‍රිස්තුස් වහන්සේ විසින් දනය කරන ලදී.
- ශුද්ධ වූ පේදුරුතුමාතේ එතුමාට පසුව අඛන්ඩව පැමිණෙන ශුද්ධෝත්තකම පියවරු ශුද්ධ වූ සභාවේ නායක්තවය දරති.
- ශුද්ධෝත්තම පියතුමන් නොවරදින සුළු භාවයේ වරම ලද කෙනෙකි.
- පැරණි ගිවිසුවේ නව ගිවිසුවේ ග්‍රන්ථ සියල්ලට දේවානුභාවයෙන් ලියන ලද ඒවාය.
- සුභද නිධාන හතම ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කරන ලද ස්වාය.
- විවාහය සක්‍රමේන්තුවකි. (13 ශ්‍රේණිය ගු.මා. පිටුව 84,85)

  ඉහත සඳහන් කරුණු ඇතුළත් වී තිබේ නම් ලකුණු ලබා දෙන්න) (ලකුණු 10)

ii. ඇලෙක්සැන්ඩර් ග්‍රෙහැම්බෙල්, අයිසෙක් නිව්ටන්, ඇල්බට් අයින්ස්ටයින්, ඇලෙක්සැන්ඩර් ප්ලෙමීර්, තෝමස් අල්වා එඩිසන්, ලුවී පාන්චර්.

- ඔවුන්ගේ හැකියා කුසලතා තුලින් දෙවියන් වහන්සේගේ හස්තය ක්‍රියාත්මක වී ඇත.
- ආගම හා විද්‍යාව යන ක්ෂේත්‍ර දෙක එකිනෙකට පටහැනි යැයි කිසිවිටක සැලකුවේ නැත.
- විද්‍යාව වනාහි දෙවිදුන් දුන් බුද්ධියෙන් සිදුකළ මිනිස් සොයා ගැනීම් සමූහයකි.
- දේව සමානාත්වය ලද මනුෂයයා බුද්ධියක්ද නිර්මාණාත්මක හැකියාවක්ද සුවිශේෂී දක්ෂතාවයන්ද උරුම ව ඇත.
- අධි තාක්ෂණික නිපැයුම් හමුවේ අභ්‍යාවකාශය පවා තරණය කර ඇත. ඒ මගින් මනුෂ්‍යයා දේව මහිමය වඩ වඩාත් අත්දැකිය යුතුය.

  (සිසුන් ලියා ඇති කරුණු අනුව ලබා දෙන්න) (13 ශ්‍රේණිය ගු.මා. පිටුව 92,93,94) (ලකුණු 10 x 2 = 20 )

08. i. අධ්‍යාපනය සහ පාසල් රජයට පවරා ගැනීම. ක්‍රිස්තියානි ආගමියන් කෙරෙහි නිර්දය විවේචන

ජනවාර්ගික ගැටලුව සහ සාම ක්‍රියාදාමය බෙදිගිය කිතුනු ආගමික ව්‍යාපාර

(සිසුන් විස්තර කර ඇති කරුණු සලකා බලා ලකුණු දෙන්න.)

(ලකුණු 10) (13 ශ්‍රේණිය ගු.මා.129,130,131 පිටු)

ii. කුඩා කළ පටන් දැහැමි ලෙස ජීවත් වීම.

ගැඹුරු විශ්වාසයක් තුළ තම ජීවිතය තබා ගැනීම.

නොදන්නා රටක. නොදන්නා භාෂා කතාකරන, නාදුනන සෙනගක් අතර කිසිදු සහායෝගයක් බලාපොරොත්තු නොවී දුෂ්කර සේවයට යොමුවීම.

දෙවියන් වහන්සේ දුන් කැඳවීම පිළිගැනීම.

ජීවිතයේ අවසානය දක්වාම අඛණ්ඩ දහම් සේවාවක නියුතු වූයේ සුව පහසුව නොතකාය.

කිතුනුවන් සොයාගොස් සේවය කලේ ඉමහත් කැපවීමෙන්ය.

ලන්දේසීන්ගෙන් බේරීම, විවිධ දුෂ්කර මාර්ගවල පා ගමනින් යෑම, කුසට ආහාර පවා නොලද සිටීම්. සිරගත වීම වැනි දුක් කරදර සතුටින් භාර ගැනීම.

එතුමාගේ අවසන් අවවාදය වුගේ 'කිසියම් කෙනෙකු මුළු ජීවිත කාලය තුළ නොසලකා හැරිය දෙයක් ඔහුගේ මරණ මොහොතේ දී ඉටුකර ගත නොහැකිය' යන්නය.

රෝගීන්ට උපස්ථාන කිරීම හා ප්‍රාතිහාර්ය කිරීම.

(මෙවැනි කරුන පෙන්වා දී ඇත්නම් ලකුණු ලබා දෙන්න.)

(13 ශ්‍රේණිය ගු.ම. පිටු 115, 116 ) (ලකුණු 10) (10 x 2 = 20)